| |
|---|
| මාර්ගෝපදේශ අංක 01/2022 |
| රා.මු.ව. 01/2020 හි |
| **07.1 ඡේදය** |
| 2022.01.18 |

**මු.රෙ. 426 යටතේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2022 වර්ෂය සඳහා මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය**

රජයේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා අදාල මාසික ගිණුම් සාරාංශ පහත 05 වන ඡේදයේ දැක්වෙන පරිදි අදාල නියමිත දිනට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් එක් එක් මාසය සඳහා වූ ඒකාබද්ධ මාසික ගිණුම් ප්‍රකාශන එළැඹෙන මාසයේ 10 වන දිනට පෙර පිළියෙල කරනු ලබන බැවින් නියමිත දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය **"cigassummary@sad.treasury.gov.lk"** විද්‍යුත් තැපැල වෙත එවිය යුතු බව අවධාරණය කරනු ලැබේ. සාවද්‍ය දත්ත භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුලත් වීම වළක්වා ගැනීම සඳහා New CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුලත් කරන දත්ත දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු පමණක් එවීමට අදාල නිලධාරීන් වග බලා ගත යුතුය. එබැවින් මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය පරික්ෂා කිරීමෙන් පසුව අදාල වන පරිදි ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරීගේ **රාජකාරී විද්‍යුත් තැපැල (e-mail) හරහා පමණක්** එවන ලෙස උපදෙස් ලබා දිය යුතුය.

3. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේදී යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සාරාංශ එවන ලද විද්‍යුත් තැපැලටම වහාම දැනුම් දෙනු ලබන අතර, අවශ්‍ය නිවැරදි කිරීම් කර නියමිත දිනට පෙර එවිය යුතුවේ. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරනු ලබන බවද අවධාරණය කෙරේ.

4. මාසික ගිණුම් සාරාංශ නියමිත දින හෝ ඊට ප්‍රථම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස වැඩි දුරටත් දැනුම් දෙන අතර යම් කිසි තාක්ෂණික ගැටළුවක් තිබේ නම් ඒ සම්බන්ධව පහත සඳහන් නිලධාරීන් දැනුවත් කර නිවැරදි කරවාගත හැකි බව ද කාරුණිකව දන්වමි.

එස්. ඩබ්ලිව්. මදනායක මහතා - අති. අධ්‍යක්ෂ ජනරාල් - 0112484737 - madanayake.s.w@sad.treasury.gov.lk

එස්. තර්ශන් මහතා - අධ්‍යක්ෂ - 0112484826 - tharsan.s@sad.treasury.gov.lk

එම්.ඩී.එන්.එස්. ජයරත්න මෙනවිය - අධ්‍යක්ෂ - 0112440857 - jayaratne.mdns@sad.treasury.gov.lk



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ. – 94 11 2484728 / ෆැක්ස් - 94 11 2473856 / විද්‍යුත් තැපැල - dgsa@sad.treasury.gov.lk

5. 2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා භාණ්ඩාගාරයට මාසික ගිණුම් සාරාංශ පහත වගුවේ දක්වා ඇති දිනට හෝ ඊට පෙර එවිය යුතු බව තවදුරටත් දන්වා සිටිමි.

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට ගිණුම් සාරාංශ එවිය යුතු අවසාන දිනය | | | |
|---|---|---|---|---|
| | උපලේඛණ - 1 | | උපලේඛණ - 11 | |
| ජනවාරි | පෙබරවාරි | 03 | පෙබරවාරි | 07 |
| පෙබරවාරි | මාර්තු | 03 | මාර්තු | 07 |
| මාර්තු | අප්‍රේල් | 04 | අප්‍රේල් | 06 |
| අප්‍රේල් | මැයි | 05 | මැයි | 06 |
| මැයි | ජූනි | 03 | ජූනි | 06 |
| ජූනි | ජූලි | 04 | ජූලි | 06 |
| ජූලි | අගෝස්තු | 03 | අගෝස්තු | 05 |
| අගෝස්තු | සැප්තැම්බර් | 02 | සැප්තැම්බර් | 06 |
| සැප්තැම්බර් | ඔක්තෝම්බර් | 03 | ඔක්තෝම්බර් | 05 |
| ඔක්තෝම්බර් | නොවැම්බර් | 03 | නොවැම්බර් | 04 |
| නොවැම්බර් | දෙසැම්බර් | 05 | දෙසැම්බර් | 06 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 429 පරිදි නිකුත් කරන 2022 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමේ මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි | | | |

ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ. – 94 11 2484728 / ෆැක්ස් - 94 11 2473856 / විද්‍යුත් තැපැල - dgsa@sad.treasury.gov.lk